# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2023

## විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

© 2023 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය (03 වන මහල)
තැ.පෙ. 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

Info@erd.gov.lk
http://www.erd.gov.lk

# අන්තර්ගතය

පිටු අංකය

1 පරිච්ඡේදය 01
ආයතනික පැතිකඩ

7 පරිච්ඡේදය 02
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

17 පරිච්ඡේදය 03
වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

25 පරිච්ඡේදය 04
කාර්යසාධන දර්ශක

26 පරිච්ඡේදය 05
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

28 පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

34 පරිච්ඡේදය 07
අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01

# ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීම පිළිබඳ වගකීම දරණ ප්‍රධානම රජයේ දෙපාර්තමේන්තුව වන අතර එය මුදල් අමාත්‍යාංශය යටතේ වන භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය ඇතිව ක්‍රියාත්මක වේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් සිව්දෙනෙකු යටතේ පාලනය වේ. 2023 වසරේ දී අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් අංශ හා ඒකක ක්‍රියාත්මක විය.

- ආසියානු සංවර්ධන බැංකු අංශය
- පෙරදිග ආසියානු අංශය
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය
- චීන හා ආසියානු යටිතල පහසුකම් හා අයෝජන බැංකු අංශය
- මැද පෙරදිග, දකුණු ආසියානු රටවල් හා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන අංශය
- දියුණු ආර්ථික අංශය
- තාක්ෂණික ආධාර අංශය
- ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය
- ණය කළමනාකරණ අංශය
- අංශ සම්බන්ධීකරණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- තොරතුරු තාක්ෂණ ඒකකය

## 1.2 ආයතනයේ, දැක්ම, මෙහෙවර හා අරමුණු

### දැක්ම

ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික සංවර්ධනය සඳහා සම්පත් ඒකරාශී කිරීම.

### මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වන පරිදි විශ්ව දැනුම, පරිචය, ප්‍රවීණතාවය හා දේශීය හා විදේශීය වෙළෙඳපොළෙන් සම්පත් සුදුසු කොන්දේසි යටතේ සපයා ගැනීම

### අරමුණු

- සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විදේශීය සම්පත් උචිත කොන්දේසි යටතේ ඒකරාශී කිරීම.
- දෙපාර්තමේන්තුව මඟින් මූලාශ්‍රය සපයන ලද සම්පත් වඩාත් හොඳින් උපයෝජනය කිරීම සඳහා විධායක හා ක්‍රියාත්මක ආයතනයන්ට පහසුකම් සැලසීම.
- එතෙර ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථා එලදායී අන්දමින් එක් රැස් කිරීම මඟින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායකවීම.
- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සම්භාරය ඵලදායී මෙන්ම කාර්යක්ෂම ලෙස ඉටු කිරීම උදෙසා දෙපාර්තමේන්තුවේ හැකියාවන් සවිමත් කිරීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

1 සංවර්ධන සහාය උපායමාර්ග හා ප්‍රමුඛතා හඳුනාගැනීමට සංවර්ධන පාර්ශ්වකරුවන් හා මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම.

2 එක් එක් සංවර්ධන පාර්ශ්වකරුවන් වාර්ෂිකව ශ්‍රී ලංකා රජය වෙත ලබාදීමට නියමිත විදේශ මූල්‍යයන්ට අදාළ වැඩසටහන්වල ක්‍රියාකාරකම් රේඛීය අමාත්‍යාංශ/ ආයතන හා සමඟ සම්බන්ධීකරණය කිරීම.

3 රේඛීය අමාත්‍යාංශ/ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ එක්ව විදේශ මූල්‍යයනය සඳහා ව්‍යාපෘති පෙළගැස්මක් පිළියෙල කිරීම.

4 විදේශාධාර ලබාදෙන විදේශීය දූත කණ්ඩායම් වල ක්‍රියාකාරකම් තත්ත්ව ගවේෂී අදියරේ සිට ඇගයීම් අදියර දක්වා සම්බන්ධීකරණය කිරීම.

5 විදේශ ආධාර පිළිබඳ සම්මුති සාකච්ඡා පැවැත්වීම හා ණය/ ප්‍රදාන ගිවිසුම් අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම සහ එම ගිවිසුම බලාත්මක කිරීම හා සම්බන්ධ පහත කාර්යයන් වල නිරත වීම.

- සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙනු ලබන නියෝජිතායතන සමඟ සම්මුති සාකච්ඡා පැවැත්වීම;
- ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් රජයේ අනුමැතිය හා අධිකාරි බලය ලබා ගැනීම
- ක්‍රියාත්මක නියෝජිතායතන සමඟ උප ණය ගිවිසුම් අත්සන් කිරීම; සහ
- ණය ගිවිසුම් බලාත්මක වීමට අවශ්‍ය පූර්ව කොන්දේසි සම්පූර්ණ කිරීම

6 විදේශීය ණය/ ප්‍රදාන මඟින් මූල්‍යයනය කරනු ලබන ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරිත්වය සොයා බැලීම සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වීම;

- සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සමාලෝචන දූත කණ්ඩායම්වල කටයුතු සම්බන්ධීකරණය හා නිර්දේශිත පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම;

- විදේශීය මුල්‍යයනය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය සඳහා රේඛීය අමාත්‍යාංශ මඟින් පිහිටුවා ඇති මෙහෙයුම් කමිටු සඳහා සහභාගිවීම හා සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ එකතුව ව්‍යාපෘති ක්‍රියාත්මකවීම පිළිබඳ ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම;


7 තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් යටතේ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන විදේශ පුහුණු අවස්ථා කළමනාකරණය කිරීම.

8 පහත සඳහන් ක්‍රියාකාරකම් මඟින් රජයේ විදේශ ණය කළමනාකරණය කිරීම සඳහා සහායදීම;

- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා ණය කළමනාකරණ පද්ධතිය (CS-DRMS) හරහා රජයේ විදේශ ණය කළඹ පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම
  - ණය ගෙවීමේ කොන්දේසි සහ ගිවිසුම් පිළිබඳ අදාළ තොරතුරු ඇතුළත් කිරීම
  - ණය/ ප්‍රදාන එකඟතා, ප්‍රතිලබ්ධි, පොලී හා වාරික ගෙවීම්, විනිමය අනුපාතික, පොලී අනුපාත සහ අදාළ සාර්ව ආර්ථික දත්ත ඇතුළත් කිරීම
- නියමිත වේලාවට ගෙවීම් පියවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ උපදෙස් ලබාදීම
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ අනෙකුත් තීරණ ගැනීමේ සහාය පිණිස විදේශ ණය සේවා පුරෝකථන දත්ත ලබාදීම
- ගිණුම්කරණය සහ ප්‍රකාශන සඳහා අදාළ ආයතන වෙත ණය දත්ත බෙදාහැරීම
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත කාර්තුමය සහ වාර්ෂික පදනමින් විදේශ ණය දත්ත වාර්තා කිරීම
- මහජන භාවිතය සඳහා සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ විදේශ ණය පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම
- දත්ත වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන් සමඟ අවස්ථානෝචිතව ණය දත්ත ප්‍රතිසන්ධානය කිරීම

| | |
|---|---|
| | - අවශ්‍ය පරිදි ණය දත්ත විශ්ලේෂණය කිරීම |
| 9 | කාරක ප්‍රාග්ධන හා රටේ සංවර්ධන අවශ්‍යතා සඳහා දේශීය අරමුදල් සම්පාදනය. |
| 10 | විදේශීය වාණිජ ණය ගැනීමේ ගනුදෙනු ව්‍යුහගත කිරීම සහ ක්‍රියාත්මක කිරීම |
| 11 | තිරසාර ණය කළමනාකරණය සඳහා සහ හිතකර දේශගුණික ව්‍යාපෘති සඳහා අවශකරන මූල්‍යකරණ පහසුකම් මූලාශ්‍රගත කිරීම සහ ව්‍යුහගත කිරීම<br>- තිරසාර මූල්‍ය ප්‍රභවයන් හඳුනා ගැනීම සහ අවශ්‍යතා පදනම මත ව්‍යාපෘති ව්‍යුහගත කිරීම<br>- හරිත මූල්‍යකරණය සඳහා ව්‍යාපෘති තෝරා ගැනීමට සහ ව්‍යුහගත කිරීමට පහසුකම් සැලසීම.<br>- හරිත මූල්‍යකරණයට අදාළ නිකුත් කිරීමෙන් පසු ක්‍රියාවලිය, වාර්තා කිරීම සහ ඇගයීම යන කාර්යයන් කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම<br>- තිරසාර දේශගුණික මූල්‍ය සම්පාදනයන් වැඩි දියුණු කිරීම සඳහා ජාතික, කලාපීය සහ ගෝලීය පාර්ශවකරුවන් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ගොඩනැගීම<br>- අදාළ පාර්ශ්වකරුවන් සමඟ සමීප සහයෝගීතාවයෙන් හරිත ව්‍යාපෘති පෙළගැස්ම සංවර්ධනයට සහාය වීම සහ පහසුකම් සැලසීම<br>- ශ්‍රී ලංකා රජයෙහි  හරිත මූල්‍යකරණ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වත්මන් මූල්‍ය පරතරය තක්සේරු කිරීම මත පදනම්ව ඵලදායී හරිත අරමුදල් සම්පාදනය සඳහා උපාය මාර්ග නිර්මාණය කිරීම, අඩු කාබන් සංවර්ධන දිශානතියක් කරා රට සංක්‍රමණය කිරීම සඳහා උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කිරීමට අදාළ පුද්ගලික මූල්‍ය ආකෘති වඩාත් ඵලදායී ලෙස බලමුලු ගැන්වීමට සහ කාබන් ණය පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන්  ශ්‍රී ලංකා රජය වෙත උපදෙස් ලබා දීම<br>- අදාළ පාර්ශවකරුවන්ගේ ධාරිතා අවශ්‍යතා තක්සේරු කිරීම, උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ධාරිතා සංවර්ධනය සිදු කිරීම |
| 12 | සියලු විදේශීය මූල්‍යයන ව්‍යාපෘතිවලට අදාළව, රජයේ වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම |

## 1.4. ආයතන ව්‍යුහය




සංවර්ධන නිලධාරී - 21

කළමනාකරණ සේවා නිලධාරී - 42

ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරී - 30

අ.අ.ජ - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ස.අ. - සහකාර අධ්‍යක්ෂ

අ - අධ්‍යක්ෂ
පරි.නි. - පරිපාලන නිලධාරී

නි.අ - නියෝජ්‍ය අධ්‍යක්ෂ
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරී

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 හැඳින්වීම හා ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයෙහි අභියෝග සමනය කිරීම සඳහා රජය විසින් ගන්නා ලද පුළුල් ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් 2022 වර්ෂය අවසානය වනවිට ආර්ථිකය ස්ථාවරත්වයට පත්වීමෙහි ආරම්භක සලකුණු පිළිබිඹු වූ අතර, 2023 දී ආර්ථික ස්ථාවරත්වය දිගු කාලීනව පවත්වා ගැනීම සඳහා ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ මූලපිරීම් තවදුරටත් ශක්තිමත් කිරීමට යම් යම් නීතිමය සහ මූල්‍ය ප්‍රතිසංස්කරණ ආරම්භ කරන ලදි. ප්‍රධානතම ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් ලෙස 2023 වර්ෂයේ මාර්තු මස 20 වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ දළ වශයෙන් ඇ.එ.ජ.ඩො.බිලියන 3ක් වූ සිව් අවුරුදු 2023-26 විස්තීරණ ණය පහසුකම් වැඩසටහනට රජය ඇතුළත්වීම දැක්විය හැකිය. රජය විසින් අනුගමනය කරන ලද ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තිය අනුව සියලුම ද්විපාර්ශ්වික ණය හිමියන් පාහේ තම අරමුදල් ලබාදීම නැවැත්වූ තත්ත්වයක් තුළ සහ (IMF-EFF) වැඩසටහන ක්‍රියාත්මක කිරීමට රජයේ කැපවීම හේතුවෙන් 2023 වර්ෂයේ දී මූල්‍ය පහසුකම් ලබාදීම වැඩි වශයෙන් සිදුවූයේ බහුපාර්ශ්වික ණයහිමියන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟිනි. ඒ අනුව, විස්තීරණ ණය පහසුකම වැඩසටහන යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකාව වෙත විශේෂ ගැනුම් හිමිකම් මිලියන 508.0ක විදේශ මූල්‍යයන ප්‍රමාණයක් ලබාදීම සිදු කරන ලදි. රජයේ අයවැය මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද මෙම විස්තීරණ අරමුදල් පහසුකම මඟින් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමේ සහාය සඳහා, 2023 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව වෙතින් ඇ.එ.ජ.ඩො. මිලියන 1,045.6ක සැලකිය යුතු ප්‍රතිපත්තිමය විදේශ මූල්‍යයන ප්‍රමාණයක් සපයනු ලැබීය. ඒ යටතේ ආර්ථික ස්ථායීකරණ වැඩසටහන සඳහා ඇ.එ.ජ.ඩො.මිලියන 350.0ක් හා මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා ඇ.එ.ජ.ඩො.මිලියන 200.0ක් ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ද, ශ්‍රී ලංකාවේ ප්‍රත්‍යස්ථ, ස්ථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන (RESET) සඳහා ඇ.එ.ජ.ඩො.මිලියන 495.6ක් ලෝක බැංකුව වෙතින් ද ලැබුණි.

2023 වර්ෂයේ තෙවන කාර්තුව අවසන්වන විට ඉන්දියාව, ජපානය, නෙදර්ලන්තය, සෞදි අරාබිය, ජර්මනිය සහ ප්‍රංශය යන ද්විපාර්ශ්වික ණයහිමියන් වෙතින් ඇ.එ.ජ.ඩො.මිලියන 222.0ක විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණයක් ලැබී ඇත. තවද, ඉන්දීය රජය සමඟ එකඟතා ඇති කර ගත් හදිසි ණය මාලාව යටතේ 2023 වර්ෂයේ පළමු කාර්තුවේදී ලද ප්‍රතිලබ්ධීන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා වූ විදේශ මූල්‍යයන අවශ්‍යතා සපුරා ගැනීමට සැලකිය යුතු ලෙස උපකාර විය.

ඒ අනුව, 2023 වර්ෂය තුළ ඇ.එ.ජ.ඩො.මිලියන 2,568.7ක සැලකිය යුතු විදේශ මූල්‍ය ප්‍රමාණයක් ලබා ගැනීමට රජයට හැකි විය.

## 2.2. ප්‍රගතිය - 2023

### 2.2.1. විදේශ මූල්‍යයන එකඟතා

රජය විසින් 2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමඟ විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 16ක් මඟින් ඇ.එ.ජ.ඩො.මිලියන 2,121ක එකඟතා ඇතිකර ගෙන ඇත. මෙය විස්තීරණ අරමුදල් පහසුකම 2023 - 26 යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද ඇ.එ.ජ.ඩො.මිලියන 728.1ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ආර්ථික ස්ථායීකරණ වැඩසටහන හා මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන යන වැඩසටහන් දෙක සඳහා ලද ඇ.එ.ජ.ඩො.මිලියන 550.0, දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන ණය කොටස 4 සඳහා ලද ඇ.එ.ජ.ඩො.මිලියන 60.0, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රත්‍යාස්ථ, ස්ථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන සඳහා ලද ඇ.එ.ජ.ඩො.මිලියන 495.6, සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය සඳහා ලද ඇ.එ.ජ.ඩො.මිලියන 196.2, හා ජපානය, කොරියාව, ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය යන විදේශ සංවර්ධන ප්‍රදායකයින් සමඟ ගිවිසුම් ගතවීමෙන් ලද ඇ.එ.ජ.ඩො.මිලියන 90.6ක පූර්ණ ප්‍රදානවලින් සමන්විත වේ.

මෙම කාල පරිච්ඡේදය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද ඇ.එ.ජ.ඩො.මිලියන 728.1 ප්‍රමාණය විදේශ මූල්‍යයන ප්‍රමාණය අනුව, පෙරමුණ ගෙන සිටින අතර, අනතුරුව පිළිවෙලින් ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (ඇ.එ.ජ.ඩො.මිලියන 696.0), ආසියානු සංවර්ධන බැංකුව (ඇ.එ.ජ.ඩො.මිලියන 610.0) ජපානය (ඇ.එ.ජ.ඩො.මිලියන 44.2), ඇමරිකා එක්සත් ජනපදය (ඇ.එ.ජ.ඩො.මිලියන 19.3) යුරෝපා සංගමය (ඇ.එ.ජ.ඩො.මිලියන 15.8) කොරියාව (ඇ.එ.ජ.ඩො.මිලියන 7.1) සමඟ විදේශ මූල්‍යයන එකඟතා ඇතිකර ගෙන ඇත.

2023 වර්ෂයේ දී අයවැය මූල්‍යකරණ අංශය සඳහා ඉහළම විදේශ මූල්‍යයන එකඟතා ලැබී ඇති අතර, එය ඇ.එ.ජ.ඩො.මිලියන 1,774.0ක් හෝ සමස්ත විදේශ මූල්‍යයන එකඟතාවලින් සියයට 84ක් විය.

| මුළු එකඟතා | විදේශ ණය | විදේශ ප්‍රදාන |
|---|---|---|
| *ඇ.එ.ජ.ඩො.මිලියන* | *ඇ.එ.ජ.ඩො.මිලියන* | *ඇ.එ.ජ.ඩො.මිලියන* |
| **2,120.5** | **2,029.9** | **90.6** |

## විදේශ මූල්‍යයන එකඟතා 2023, සංවර්ධන පාර්ශ්වකරු අනුව


| සංවර්ධන පාර්ශ්වකරු | වටිනාකම (ඇ.එ.ජ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්වීපාර්ශ්වීය** | **-** | **70.6** | **70.6** |
| ජපානය | - | 44.2 | 44.2 |
| ඇමරිකා එක්සත් ජනපදය | - | 19.3 | 19.3 |
| කොරියාව | - | 7.1 | 7.1 |
| **බහුපාර්ශ්වීය** | **2,029.9** | **20.0** | **2,049.9** |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 728.1 | - | 728.1 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | 691.8 | 4.2 | 696.0 |
| ආසියානු සංවර්ධන බැංකුව | 610.0 | - | 610.0 |
| යුරෝපා සංගමය | - | 15.8 | 15.8 |
| එකතුව | **2,029.9** | **90.6** | **2,120.5** |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන : එක් එක් විදේශ විනිමයයෙන් සටහන් වන එකඟතා අගයයන් ඇ.එ.ජ.ඩො. හා රුපියල් බවට හැරවීමේදී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.*


*විශේෂ ගැණුම් හිමිකම් විනිමය ඇ.එ.ජ. ඩො. හා රුපියල් බවට හැරවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.*

### විදේශ මූල්‍යයන එකඟතා 2023, ප්‍රධාන සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය අනුව (ඇ.එ.ජ.ඩො.මිලියන)




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

### විදේශ මූල්‍යයන එකඟතා 2023, ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ.එ.ජ.ඩො.මිලියන)




**වෙනත්- අධ්‍යාපන හා පුහුණු, ධීවර, සංචාරක හා හෝටල් කර්මාන්ත*

# 2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ඇතිකර ගත් නිල සංවර්ධන සහයෝගීතා, අයවැය මූල්‍යකරණය හා ප්‍රතිපත්ති ණය අදාළ මූල්‍ය කොන්දේසි සමග

| සංවර්ධන පාර්ශ්වක රු/ ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය (දිනය/මාසය/වර්ෂය) | ව්‍යාපෘතිය වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදලය | අත්සන් කරන ලද මුදලින් | රුපියල් | ඇ.එ.ජ. ඩොලර් | පොලිය: වර්ගය | පොලිය: වාර්ෂික අනුපාතය (සියයට) | පොලිය: සීමාන්තිකය (පදනම් අංක සියයට) | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/ උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට)(වර්ෂ) |
| ජපානය | ප්‍රදාන | 22/2/2023 | ජපාන ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ඉන්ධන ප්‍රදාන සහයෝගීතාවය | ජපන් යෙන් | 5,000.0 | 13,423.0 | 37.1 | අදාල නොවේ | | | | | 3 |
| | ප්‍රදාන | 26/4/2023 | වෛද්‍ය හෝ සායනික අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 503.0 | 1,211.7 | 3.8 | අදාල නොවේ | | | | | 3 |
| | ප්‍රදාන | 9/8/2023 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව සඳහා වන ජපන් ආධාර වැඩසටහන | ජපන් යෙන් | 284.0 | 636.2 | 2.0 | අදාල නොවේ | | | | | 3 |
| | ප්‍රදාන | 22/11/2023 | ධීවර කර්මාන්තය සඳහා ආධාරක උපකරණ සැපයීම සඳහා ජපාන රජයේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ජපන් රජය විසින් ලබාදෙනු ලබන ජපන් යෙන් මිලියන 200 ක සහයෝගීතාව | ජපන් යෙන් | 200.0 | 442.9 | 1.4 | අදාල නොවේ | | | | | 3 |
| කොරියාව කොරියාව | ප්‍රදාන | 31/5/2023 | චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන් වැව යන ජලාශයන්හි මතුපිට අවකාශය මත ධාරිතාවය මෙගා වොට් 1 බැගින් වන පාවෙන සූර්ය පැනල පද්ධති බලාගාර ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය | කොරියානු වොන් | 6,830.0 | 1,524.4 | 5.1 | අදාල නොවේ | | | | | 1 |
| | ප්‍රදාන | 12/5/2023 | ශ්‍රී ලංකාවේ නියාගම ජාතික වෘත්තීය පුහුණු ආයතනයෙහි ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම මත පදනම් වූ කාර්මික, වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම | කොරියානු වොන් | 2,150.0 | 516.2 | 1.6 | අදාල නොවේ | | | | | 1 |
| | ප්‍රදාන | 15/2/2023 | ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ උතුරු නැගෙනහිර පළාත් කේන්ද්‍ර කරගනිමින් ප්‍රජා පාදක සංචාරක ව්‍යාපෘතිය | කොරියානු වොන් | 400.0 | 117.8 | 0.3 | අදාල නොවේ | | | | | 1 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | ප්‍රදාන | 28/7/2023 | ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රවාදය ශක්තිමත් කිරීම හා ජනජීවිතය සමෘද්ධිමත් කිරීමේ ආධාර වැඩසටහන (අරමුදල් වැඩිකිරීම) | ඇ.එ.ජ.ඩො | 13.2 | 4,356.3 | 13.2 | අදාල නොවේ | | | | | 4 |
| | ප්‍රදාන | 17/8/2023 | ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රවාදය ශක්තිමත් කිරීම හා ජනජීවිතය සමෘද්ධිමත් කිරීමේ ආධාර වැඩසටහන (අරමුදල් වැඩිකිරීම) | ඇ.එ.ජ.ඩො | 6.0 | 1,926.6 | 6.0 | අදාල නොවේ | | | | | 4 |
| **බහුපාර්ශ්වීය** | | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 29/5/2023 | ආර්ථික ස්ථායීකරණ වැඩසටහන | ඇ.එ.ජ.ඩො | 350.0 | 104,689.1 | 350.0 | විචල්‍ය | SOFR | 2 | පොරොන්දු ගාස්තු 0.75% | 4 | 8 |
| | ණය | 28/11/2023 | දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන ණය කොටස 4 | ඇ.එ.ජ.ඩො | 60.0 | 19,740.2 | 60.0 | ස්ථාවර | 2 | අදාල නොවේ | - | 5 | 25 |
| | ණය | 11/12/2023 | මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන | ඇ.එ.ජ.ඩො | 200.0 | 65,386.3 | 200.0 | ස්ථාවර | 2 | අදාල නොවේ | - | 5 | 25 |
| යුරෝපා සංගමය | ප්‍රදාන | 23/10/2023 | ආහාර අංශයේ චක්‍රීය ආර්ථිකය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යුරෝ | 15.0 | 5,158.2 | 15.9 | අදාල නොවේ | | | | | 5 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 28/6/2023 | ශ්‍රී ලංකාවේ ප්‍රත්‍යස්ථ, ස්ථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන | වි.ගැ.හි *SDR | 371.2 | 153,049.4 | 495.6 | පොළී රහිත | | | පොරොන්දු ගාස්තු 0.5% | 6 | 12 |
| | ණය | 21/9/2023 | සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය | *SDR | 148.5 | 63,724.8 | 196.2 | ස්ථාවර | 1.25 | N/A | සේවා ගාස්තු 0.75%<br>පොරොන්දු ගාස්තු 0.5% | 5 | 30 |
| | ප්‍රදාන | 6/7/2023 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | ඇ.එ.ජ.ඩො | 4.2 | 1,289.3 | 4.2 | අදාල නොවේ | | | | | 3 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | Loan | 20/3/2023 | ශ්‍රී ලංකාවේ 2023-26 විස්තීරණ අරමුදල් පහසුකම | *SDR | 508.0 | 244,110.6 | 728.1 | Amount Based | | | පොරොන්දු ගාස්තු 0.5%<br>සේවා ගාස්තු 0.5% | 5 | 11 |
| **එකතුව** | | | | | | **681,303.0** | **2,120.5** | | | | | | |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*
*සටහන : SOFR = Secured Overnight Financing Rate*
*විදේශ විනිමයෙන් සටහන් වන එකගතා අගයයන් ඇ.එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*
*විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.*

### 2.2.2. විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා, සංවර්ධන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ.එ.ජ.ඩො.මිලියන 2,568.7කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ඇ.එ.ජ.ඩො.මිලියන 2510.3ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර, ඇ.එ.ජ.ඩො.මිලියන 58.4ක් පූර්ණ ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි විය.

2023 වර්ෂය තුළ ලද මෙම ප්‍රතිලබ්ධි වලින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුව සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව ලබා ගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 33ක් ද අනතුරුව ඉහළම ප්‍රමාණයක් ලෝක බැංකුව (සියයට 29) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (සියයට 27) සමඟ අත්සන් කරන ලද ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

**2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි, සංවර්ධන පාර්ශ්වකරු අනුව**


| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | උපලබ්ධි ප්‍රමාණය* (ඇ.එ.ජ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වීය** | **176.1** | **45.8** | **221.9** |
| ඉන්දියාව | 142.5 | - | 142.5 |
| ජපානය | - | 39.6 | 39.6 |
| නෙදර්ලන්තය | 24.7 | - | 24.7 |
| සෞදි අරමුදල | 7.6 | - | 7.6 |
| ජර්මනිය | - | 6.0 | 6.0 |
| ප්‍රංශය | 1.3 | 0.2 | 1.5 |
| **බහුපාර්ශ්වීය** | **2,334.2** | **12.6** | **2,346.8** |
| ආසියානු සංවර්ධන බැංකුව | 853.9 | 3.0 | 856.9 |
| ලෝක බැංකුව | 743.6 | 9.6 | 753.2 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 681.5 | - | 681.5 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 24.2 | - | 24.2 |
| ඔපෙක් අරමුදල | 21.3 | - | 21.3 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 9.7 | - | 9.7 |
| **එකතුව** | **2,510.3** | **58.4** | **2,568.7** |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*
*සටහන : එක් එක් විදේශ විනිමයයෙන් සටහන් වල ප්‍රතිලබ්ධි අගයයන් ඇ.එ.ජ.ඩො. හා රුපියල් බවට හැරවීමේදී එක් එක් ප්‍රතිලබ්ධීන් සිදුවූ දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.*
** තාවකාලික අගයයන්*


මෙම වර්ෂයේ සිදුවූ ප්‍රතිලබ්ධිවලින් සියයට 67 කට ආසන්න වැඩි ප්‍රමාණයක් අයවැය මූල්‍යකරණය සඳහා යොදවා ඇති අතර, අනතුරුව සියයට 5 බැගින් වූ ප්‍රමාණයක් වෙළඳ අංශයේ ව්‍යාපෘතිවල හා සෞඛ්‍යය හා සමාජ සුබසාධන අංශයේ ව්‍යාපෘතිවල ද, මාර්ග හා පාලම් අංශයේ හා ප්‍රවාහන අංශයේ ව්‍යාපෘතිවල සියයට 4ක බැගින් වූ ප්‍රමාණයක් ද යොදවා ඇත.

## 2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රතිලබ්ධීන්

**ප්‍රතිලබ්ධීන් 2023, සංවර්ධන පාර්ශ්වකරු/ ණය දෙන ආයතනය අනුව *(ඇ.එ.ජ.ඩො. මිලියන)***




**ප්‍රතිලබ්ධීන් 2023, ප්‍රධාන ආර්ථික අංශ අනුව *(ඇ.එ.ජ.ඩො. මිලියන)***




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*
** වෙනත් = කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, සෞදි අරමුදල, ජර්මනිය, ප්‍රංශය*
*** වෙනත් = නිවාස සහ නාගරික සංවර්ධන, ග්‍රාමීය සංවර්ධනය, මානුෂීය ආධාර, විදුලිය සහ බලශක්ති, විද්‍යා සහ තාක්ෂණය, ආරක්ෂක, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන, ඉඩම් සංවර්ධනය, පරිසරය, ආපදා කළමනාකරණය, වැවිලි, යුක්තිය සහ පාලනය*

### 2.2.3. එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනයවීමට නියමිත ශේෂය[1]

දැනට පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2023 දෙසැම්බර් 31 දින වනවිට ඇ.එ.ජ.ඩො.බිලියන 5.9ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය චීනය විසින් ලබාදීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් ජපානය, ඉන්දියාව, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදීමට නියමිතය. එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ශේෂයෙන් සියයට 22ක ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 16ක ප්‍රමාණයක් ජලසම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 11ක ප්‍රමාණයක් ප්‍රවාහන අංශයේ ද එකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිත ය.

[1] ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තිය අනුව බලපෑමට ලක්විය.


## 2023 දෙසැම්බර් 31 වන විට පළකරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධිවීමට නියමිත ශේෂය - ප්‍රධාන ආර්ථික අංශ අනුව

| ප්‍රධාන ආර්ථික අංශය | එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනයවීමට නියමිත ශේෂය* (ඇ.එ.ඩො.මිලියන) |
|---|---|
| මාර්ග හා පාලම් | 1,314 |
| ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 972 |
| ප්‍රවාහනය | 661 |
| වෙළෙඳ | 529 |
| අධ්‍යාපනය හා පුහුණුව | 431 |
| විදුලිබල හා බලශක්ති | 260 |
| සෞඛ්‍යය හා සමාජ සුභසාධනය | 240 |
| වාරිමාර්ගසහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 236 |
| මානුෂීය ආධාර | 213 |
| **වෙනත් | 1,062 |
| **එකතුව** | **5,917** |

*මූලාශ්‍ර : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*
**තාවකාලික අගයන්*

*** වෙනත් - නිවාස සහ නාගරික සංවර්ධන, ආරක්ෂක, කෘෂිකර්ම, මාධ්‍ය, ග්‍රාමීය සංවර්ධනය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන, විද්‍යාව සහ තාක්ෂණය, ඉඩම්, සංවර්ධනය, ක්‍රීඩා යටිතලපහසුකම්, පශු සම්පත් සංවර්ධනය, වරාය සහ නාවික, කම්කරු සහ වෘත්තීය පුහුණුව, ආපදා කළමනාකරණය, යුක්තිය සහ පාලනය පෞද්ගලික අංශයේ සංවර්ධනය, පරිසරය, සහ වැවිලි කර්මාන්ත*

## 2023 දෙසැම්බර් 31 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.එ.ජ.ඩො.මිලියන)





*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

### 2.2.4. විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2023 දෙසැම්බර් 31 වන විට රජය විසින් ලබාගත් විදේශ ණය මුලයයනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.එ.ජ.ඩොලර් බිලියන 37.3[2] කි. ණය දෙන ආයතන කාණ්ඩය අනුව විදේශ ණය සංයුතිය පහත රූපසටහනෙන් දැක්වේ.

**2023 දෙසැම්බර් 31 දින වනවිට මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය (ඇ.එ.ජ.ඩො. මිලියන)**




***මූලාශ්‍රය**: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීම් සහ කාලීන ණය පහසුකම් ඇතුළත් වාණිජ ණය මධ්‍යම රජයේ මුළු විදේශ ණයවලින් (සියයට 39) ක ප්‍රමාණයක් නියෝජනය කරන අතර, ඉතිරිය පිළිවෙලින් බහුපාර්ශ්වික ණය (සියයට 32) සහ ද්විපාර්ශ්වික ණය (සියයට 29) මඟින් නියෝජනය වේ.

තවද, 2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද ණය සේවාකරණය[3] ඇ.එ.ජ.ඩො.මිලියන 1,439.9කි. මෙයින්, ඇ.එ.ජ.ඩො.මිලියන 1,031.3ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.එ.ජ.ඩො.මිලියන 408.6ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

රජය විසින් අනුගමනය කරන ලද ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 අප්‍රේල් 12 වන දින සිට ආරම්භ වන පරිදි අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2022 අප්‍රේල් 12 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා නොගෙවා ඇති ණය වාරික ප්‍රමාණය ඇ.එ.ජ.ඩො.මිලියන 4,451ක්ද, පොලී ප්‍රමාණය ඇ.එ.ජ.ඩො.මිලියන 2,080.9* ක් ද විය. මෙම නොගෙවූ ණය පිළිබඳව ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ දී අදාළ ණය හිමියන් සමඟ සාකච්ඡා කිරීමට රජය විසින් පියවර ගනු ඇත.

---

[2] තාවකාලික අගයයන්, ණය සේවාකරණය තාවකාලිකව නතරකිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතුවූ නොගෙවූ ණය වාරිකද ඇතුළුව ඇති මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.
[3] ණය සේවාකරණය = ණය ආපසු ගෙවීම + පොලී ගෙවීම
* ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සම්මුති සාකච්ඡාවලදී එක් එක් ණය හිමියා සමඟ සැසඳීමට යටත් වේ.

සහතික කළේ:

නම: ඩී.ඒ.පී. අබේසේකර

තනතුර: අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

අත්සන:

ඩී.ඒ.පී. අබේසේකර
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

# 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1. මූලික කාර්යසාධන ප්‍රකාශනය

ඒසීඒ-එෆ්

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය | | සටහන | රුපියල් තත්‍ය 2023 | රුපියල් තත්‍ය 2022 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ -1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ -1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ -1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ -1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | **-** | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,667,441,195 | 1,773,453,650 | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 383,084 | 45,435 | ඒසීඒ -4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 7,213,293 | 7,708,550 | ඒසීඒ - 5/5(a)/5(b) |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 721,919,011 | 848,780,301 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **2,396,956,583** | **2,629,987,936** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඇ) = (අ) + (ආ)** | | **2,396,956,583** | **2,629,987,936** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 342,557 | 17,357,578 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ) = (ඇ) - (ඈ)** | | **2,396,614,026** | **2,612,630,358** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අඩු කළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | - | - | |
| - | | | | | |
| 121,150,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 106,173,058 | 101,262,342 | |
| 79,752,350 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 68,273,992 | 59,207,613 | ඒසීඒ -2(ii) |
| 250,377,650 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 128,703,065 | 72,326,939 | |
| | පොළී ගෙවීම් | 8 | - | - | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **451,280,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **303,150,115** | **232,796,894** | |
| | **මූලධන වියදම්** | | | | |
| 3,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 227,978 | 1,342,655 | |
| 17,100,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 4,757,216 | 7,257,170 | |
| 1,366,156,140 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 1,365,563,607 | 1,540,022,232 | ඒසීඒ -2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 723,919,011 | හැකියා වර්ධනය | 14 | 722,002,511 | 849,454,724 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | | |
| | **මුළු මූලධන වියදම් (උ)** | | **2,092,551,312** | **2,398,076,781** | |
| | තැන්පතු ගෙවීම් | | 383,084 | 45,435 | ඒසීඒ -4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 6,313,401 | 5,393,012 | ඒසීඒ -5 |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **6,696,485** | **5,438,447** | |
| | **මුළු වියදම් (එ) = (ඊ+උ+ඌ)** | | **2, 402,397,912** | **2,636,312,122** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය (ඒ) = (ඉ) – (එ)** | | **(5,783,886)** | **(23,681,764)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (5,783,886) | (23,681,764) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | ඒසීඒ-3 |
| | | | (5,783,886) | (23,681,764) | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සතා 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 173,935,794 | 182,081,925 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 17,551,939 | 18,451,833 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **191,487,734** | **200,533,758** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 17,551,939 | 18,451,833 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 173,935,794 | 182,081,925 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **191,487,733.22** | **200,533,758** |

පිටු අංක......07......සිට ......26...... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ......27...... සිට ......34...... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | සහකාර අධ්‍යක්ෂ (මුදල්) - වැ.බ. |
| නම : කේ.ඒම්. මහින්ද සිරිවර්ධන | නම : ඩී.ඒ.පී. අබේසේකර | නම : ජී.ජී.ඩී. මධුරංගන |
| තනතුර : ලේකම් | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් | දිනය : 2024/02/19 |
| දිනය : 27 | දිනය : 2024/02/19 | |
| කේ.එම්. මහින්ද සිරිවර්ධන ලේකම් මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් මුදල් අමාත්‍යාංශය කොළඹ 01. | ඩී.ඒ.පී. අබේසේකර අධ්‍යක්ෂ ජනරාල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01 | G.G.D. Madurangana Assistant Director (Finance) (Actg.) Department of External Resources General Treasury Colombo - 01, Sri Lanka. |

# 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ -සී**

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | 2023 | 2022 |
| | රු. | රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| ආදායම් නොවන ලැබීම් | 553,031 | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 728,952,196 | 873,403,116 |
| අග්‍රිම ලැබීම් | 1,667,441,195 | 1,773,453,650 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 7,501,673 | 7,311,647 |
| තැන්පත් ලැබීම් | 383,084 | 45,435 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,404,931,179** | **2,654,213,848** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 174,173,231 | 160,469,956 |
| සහනාධාර සහ මාරුකිරීම් | 129,003,065 | 72,326,939 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 2,308,905 | 90,561 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 342,557 | 17,357,578 |
| අත්තිකාරම් ගෙවීම් | 6,069,025 | 5,846,597 |
| තැන්පතු ගෙවීම් | 383,084 | 45,435 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **312,279,867** | **256,137,066** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඇ)-(අ)-(ආ)** | **2,092,551,312** | **2,398,076,782** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| | - | - |

| | | |
|---|---|---|
| උප ණය අයකර ගැනීම් | - | - |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)</u>** | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| මූලධන වියදම් | 2,092,551,312 | 2,398,076,782 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,092,551,312** | **2,398,076,782** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)-(ඈ)-(ඉ)** | **(2,092,551,312)** | **(2,398,076,782)** |
| | **-** | **-** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | - | - |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)** | - | - |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | - | - |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඵ)** | **-** | **-** |
| | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)-(උ)-(ඵ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) - (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | |

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

**<u>වාර්තා කිරීමේ පදනම</u>**

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදයන් වේ.

2) <u>මිණුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරිම වැඩිදියුණු කලළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනා ගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගෙන ඇත.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.5. ආදායම් එකතු කිරීමෙන් කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුදල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |

____________________අදාළ නොවේ____________________

## 3.6. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ ප්‍රතිපාදන

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදන | | |
| **පුනරාවර්තන** | 451,280,000 | 451,280,000 | 303,150,115 | 67.1% |
| **ප්‍රාග්ධන** | 1,340,200,000 | 2,110,675,151 | 2,092,551,312 | 99.1% |

## 3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |

____________________අදාළ නොවේ____________________

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 148,588,865.51 | | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 9,446,928.97 | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | 15,900,000.00 | | | |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන 2023 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 හි අමුණා ඇත.

පරිච්ඡේදය 04

# කාර්යසාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| මූල්‍ය එකඟතා | 96.5 | | |
| මූල්‍ය උපයෝජන | 93.6 | | |
| තාක්ෂණික පුහුණු අවස්ථාවන් (නිලධාරීන් ගණන) | 112.7 | | |

# තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය (SDG)

## 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම | ඇ.ඩ.ජ.ඩො මිලියන 530 | ප්‍රතිලාභී හෝ දායක රට සැපයුම් මාදිලිය (නිල සංවර්ධන ආධාර, සෘජු විදෙස් ආයෝජන හෝ වෙනත් සැපයුම්) අනුව සංවර්ධනය සඳහා වන සමස්ත සම්පත් ගලනය<br>ලද ප්‍රමාණය:<br>ඇ.ඩ.ජ.ඩො.මිලියන *: 454* | | | 86 |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණ ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම | ඇ.ඩ.ජ.ඩො මිලියන 470 | යටිතල පහසකම් සඳහා වන සමස්ත නිල ජාත්‍යන්තර සහාය (නිල සංවර්ධන ආධාර සහ වෙනත් නිල වශයෙන් ලැබෙන සැපයුම්)<br>ලද ප්‍රමාණය:<br>ඇ.ඩ.ජ.ඩො.මිලියන *:385* | | | 82 |
| පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 1,200 | ක්ෂේත්‍රය සහ ඉගෙනුම් ආකාරය අනුව, ශිෂ්‍යත්ව සඳහා නිල සංවර්ධන ආධාර ගලා යාමේ ප්‍රමාණය<br>ලැබුණු අවස්ථා ගණන *:*<br>*1,352* | | | 113 |

## 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් වාර්ෂික විදේශ අරමුදල් ලබාදීම සිදුකරන අතර එය මුළු එකඟතා ලෙස සටහන් කර ගනී. රේඛිය අමාත්‍යාංශ මඟින් කෘෂි කර්මාන්තය, වාරිමාර්ග, නිපුණතා සංවර්ධන, අධ්‍යාපනය, දරිද්‍රතාව පිටුදැකීම, මාර්ග හා මහාමාර්ග, නාගරික සංවර්ධන හා සෞඛ්‍යය වැනි විවිධ අංශයන්හි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙම එකඟ වූ අරමුදල් උපයෝජනය කරනු ලැබේ.

කෙසේ වෙතත්, පරිසර නිෂ්කාශනය, ඉඩම් අත්පත්කර ගැනීම, උපයෝගිතා සේවාවන් ප්‍රතිස්ථාපනය කිරීම, නැවත ස්ථානගත කිරීම හා නැවත පදිංචි කිරීම, තක්සේරු කිරීම හා ප්‍රසම්පාදනය වැනි ව්‍යාපෘති සූදානමට සම්බන්ධ ගැටළු හේතුවෙන් උපයෝජනයන් සැලසුම් කළ පරිදි සාක්ෂාත් කර ගත නොහැකි වේ

පරිච්ඡේදය 06

# මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 43 | 37 | 6 |
| තෘතීයික | 3 | 3 | 0 |
| ද්විතියික | 66 | 60 | 6 |
| ප්‍රාථමික | 31 | 25 | 6 |

## 6.2. **ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

විවිධ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් විවිධ නියමයන් හා කොන්දේසි මත සහ අමාත්‍ය මණ්ඩලය, මහ බැංකුවේ මුදල් මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව සහ ජනාධිපති ලේකම් කාර්යාලය ආදියෙන් නිසි අනුමැතිය ඇතිව විදේශ සම්පත් ඒකරාශී කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ශාත් කරගැනීම සඳහා සම්මුති සාකච්ඡා පැවැත්වීමේ කුසලතා, භාෂා කුසලතා සහ ආර්ථික විද්‍යාව, රාජ්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය, සංඛ්‍යානය, ව්‍යාපෘති සැලසුම්කරණය සහ ක්‍රියාවට නැංවීම, ණය කළමණාකරණය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආදී විෂය ක්ෂේත්‍රයන්ගේ වැඩකිරීමට මනා දැනුමක් සහිත කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. පුහුණුව ලත් නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රමය හරහා වෙනත් ස්ථානවලට මාරු කරන අතර, එම පුරප්පාඩු වෙනත් ස්ථානවලින් මාරුවීම් ලැබ පැමිණෙන නිලධාරීන්ගෙන් පුරවනු ලැබේ. මෙලෙස වාර්ෂික ස්ථාන මාරුවීම් හරහා පැමිණෙන නිලධාරීන් අතුරින් අවශ්‍ය කෙරෙන කුසලතා සහ දැනුමෙන් සමන්විත නිලධාරීන් සොයා ගැනීම ඉතා අසීරු අතර, එම නිලධාරීන් පුහුණු කිරීමට දෙපාර්තමේන්තුවට අවම වශයෙන් වසර දෙකක්වත් ගතවේ. මෙය දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යක්ෂමතාවයට බලපායි.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසට හනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහ නේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| කළමනාකරණ තීරණ ගැනීම සඳහා දත්ත විද්‍යාව | 1 | 2023 පෙබරවාරි 19 - 27 | | 131,795.07 | විදේශ | කළමනාකරණ තීරණ ගැනීම සඳහා දත්ත විද්‍යා ක්‍රමවල අත්‍යවශ්‍ය අංග ලබා ගැනීමට හැකි විය. තීරණ ගැනීමේදී භාවිතා කළ හැකි විවිධ වර්ගයේ සංඛ්‍යාන ක්‍රම භාවිතා කර වැඩසටහන තුල ඉගෙන ගන්නා ලදී.<br>1. ගණිතමය වැඩසටහන්කරණය සහ තීරණ විශ්ලේෂණය<br>2. කාල ශ්‍රේණි විශ්ලේෂණය<br>3. ප්‍රශස්තකරණය<br>4. Excel හි විශ්ලේෂණාත්මක කාර්යයන් |
| Tableau සහ Advanced Excel භාවිතා කරමින් දත්ත විශ්ලේෂණ | 1 | 2023 මාර්තු 26 – අප්‍රේල් 09 | | 129,164.4 | විදේශ | Tableau සහ Advanced Excel භාවිතයෙන් දත්ත විශ්ලේෂණ පිළිබඳ දැනුම |
| දේශගුණික විපර්යාස පිළිබඳ සාර්ව ආර්ථික විද්‍යාව | 1 | 2023 අප්‍රේල් 23 - මැයි 05 | | 11,450.73 | විදේශ | දේශගුණික විපර්යාස පිළිබඳ සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම |
| අවදානම් විනිශ්චය පිළිබඳ IMF පාඨමාලාව | 1 | 2023 මැයි 06 - 20 | | 91,157.5 | විදේශ | මූල්‍ය, මූල්‍ය, බාහිර සහ සැබෑ අංශවල අවදානම් දර්ශක භාවිතා කරමින් අවදානම් තක්සේරු කිරීම පිළිබඳ දැනුම සහ කුසලතා සහ බහු-ආංශික දුර්වලතා නිරීක්ෂණය කිරීමට සහ වලිග අවදානම් දර්ශක පුරෝකථනය කිරීමට මෙවලම් භාවිතා කිරීම. |
| හරිතකරණය මූල්‍ය පද්ධති සහ MDB හි | 1 | 2023 මැයි 16 - 19 | | 4,501.64 | විදේශ | ජාලකරණය සහ හරිත මූල්‍ය පද්ධතිවල නව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාර්යභාරය පිළිබඳ සම්මන්ත්‍රණය | | | | | | නව්‍ය සංකල්ප හඳුන්වාදීම |
| මැලේසියානු තාක්ෂණික සහයෝගීතා වැඩසටහන (MTCP) ජාත්‍යන්තර සහභාගිවන්නන් සඳහා රාජ්‍යතාන්ත්‍රික පුහුණු පාඨමාලාව 2023 | 1 | 2023 ජූලි 23 අගෝස්තු 01 | | 75,529.16 | විදේශ | 1. අර්බුදකාරී අවස්ථාවක තීරණ ගැනීම<br>2. ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වය<br>3. මැලේසියාවේ ද්විපාර්ශ්වික රාජ්‍ය තාන්ත්‍රික පිළිවෙත්<br>4. මැලේසියාවේ බහුපාර්ශ්වික රාජ්‍ය තාන්ත්‍රික භාවිතයන්<br>5. මැලේසියාව සහ ආසියානු සබඳතාව |
| ශ්‍රී ලංකාව සඳහා හරස් මායිම් විද්‍යුත් වාණිජ්‍යය පිළිබඳ සම්මන්ත්‍රණය | 2 | 2023 අගෝස්තු 05 - 21 | | 270,416.2 | විදේශ | 1. නැගී එන ආර්ථිකයන් සඳහා ජාත්‍යන්තර මාර්ගගත වෙළඳාම<br>2. චීනයේ අන්තර් ජාතික අන්තර්ජාල වාණිජ්‍යයේ සමකාලීන භූ දර්ශනය සහ දළ දේශීය නිෂ්පාදිතය සහ ණය තිරසාරභාවය කෙරෙහි එහි බලපෑම<br>3. සංවර්ධනය වෙමින් පවතින ජාතීන් සඳහා ඩිජිටල් වෙළඳ වේදිකා ඉදිකිරීමේ ප්‍රගතිය සහ බාධා |
| රාජ්‍ය ණය කළමනාකරණය සහ ණය තිරසාර බව | 2 | 2023 අගෝස්තු 27 - සැප්තැම්බර් 02 | | 123,007.98 | විදේශ | 1. ණය කළමනාකරණ න්‍යාය සහ මාර්ගෝපදේශ<br>2. ණය කළමනාකරණ උපාය මාර්ගය සහ භාවිතයන්<br>3. තායිලන්තය රාජ්‍ය ණය ක්‍රමය කළමනාකරණය කරයි<br>4. මූල්‍යකරණය සහ ව්‍යාපෘති ඇගයීම |
| ආයෝජන ව්‍යාපෘතිවල ආර්ථික විශ්ලේෂණය පිළිබඳ දකුණු ආසියා කලාපීය පුහුණු වැඩමුළුව | 1 | 2023 සැප්තැම්බර් 17 - 22 | | 41,614.57 | විදේශ | ආයෝජන ව්‍යාපෘතිවල ආර්ථික විශ්ලේෂණය (ව්‍යාපෘති පිරිවැය, ප්‍රතිලාභ සහ සංවේදීතා විශ්ලේෂණය, පාරිසරික බාහිර කරුණු) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ණය තිරසාරභාවය සඳහා ප්රතිපත්ති සහ උපකරණ පිළිබඳ වැඩමුළුව | 3 | 2023 සැප්තැම්බර් 25 - 29 | | 135,208.10 | විදේශ | 1. ණය තිරසාර විශ්ලේෂණය<br>2. මධ්‍ය කාලීන ණය උපායමාර්ගය<br>3. ආසියාවේ ණයවල මෑතකාලීන පරිණාමය<br>4. අවිනිශ්චිත වගකීම් |
| ADB: TA 6627 බෙදා හැරීම පිළිබඳ කලාපීය පුහුණු වැඩමුළුව දකුණු ආසියාව සඳහා දේශගුණික විසඳුම් | 1 | 2023 සැප්තැම්බර් 11 - 17 | | 49,744.53 | විදේශ | දකුණු ආසියාව සඳහා දේශගුණික විසඳුම් ලබා දීම පිළිබඳ දැනුම |
| Smart City ප්‍රතිපත්ති පාඨමාලාව | 1 | 2023 සැප්තැම්බර් 16 - 29 | | 13,2448.6 | විදේශ | Smart City ප්‍රතිපත්ති පාඨමාලාව පිළිබඳ දැනුම |
| ආපදා සහ වසංගත මූල්‍යකරණය සඳහා පරිසරය සක්‍රීය කිරීම ශක්තිමත් කිරීම පිළිබඳ කලාපීය සංසදය | 1 | 2023 සැප්තැම්බර් 18 - 21 | | 48,968.74 | විදේශ | 1. DRM පිළිබඳ දැනුවත් ADB මූල්‍ය පහසුකම් සහ අවස්ථා<br><br>2. DRM සඳහා මූල්‍යකරණය පිළිබඳ අනෙකුත් ආසියා පැසිෆික් රටවල් වල දැනුම |
| තරුණ හා මධ්‍යම - වයස්ගත රාජ්‍ය තාන්ත්‍රිකයින් පිළිබඳ සම්මන්ත්‍රණය - සංසදය 14 | 1 | 2023 සැප්තැම්බර් 12 - 26 | | 116,250.7 | විදේශ | සීමිත කාල සීමාවක් තුළ චීනයේ දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික ක්ෂේත්‍රවල සංවර්ධනය සහ අත්දැකීම් පිළිබඳ දැනුම, චීනයේ රාජ්‍යතාන්ත්‍රික උපාය මාර්ග සැකසීම, චීනයේ මූලික විදේශ ප්‍රතිපත්තිය ප්‍රසිද්ධ කිරීම, චීනයේ සංවර්ධනයේ සාර්ථක අත්දැකීම් හඳුන්වා දීම සහ චීනය සහ විදේශ රටවල් අතර සබඳතාව ප්‍රවර්ධනය කිරීම. සහ ඒකාබද්ධව දේශපාලන හා ආර්ථික හුවමාරුව ප්‍රවර්ධනය |
| චීනයේ විදේශ ආධාර ව්‍යාපෘති පිළිබඳ | 4 | 2023 ඔක්තෝබර් 08 - 25 | | 544,805.08 | විදේශ | චීනයේ විදේශ ආධාර ව්‍යාපෘති පිළිබඳ දැනුම - AIBO |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සම්මන්ත්‍රණය - AIBO | | | | | | |
| ඉන්දියන් සාගරය අවට රටවල් සඳහා දිළිඳුකම තුරන් කිරීම සහ ග්‍රාමීය පුනර්ජීවනය පිළිබඳ සම්මන්ත්‍රණය | 2 | 2023 නොවැම්බර් 05 - 21 | | 276,053.46 | විදේශ | ඉන්දියන් සාගරය අවට රටවල් සඳහා දිළිඳුකම තුරන් කිරීම සහ ග්‍රාමීය පුනර්ජීවනය පිළිබඳ දැනුම |
| ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික AIBO පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 2023 නොවැම්බර් 21 - දෙසැම්බර් 08 | | 123,033.75 | විදේශ | ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික AIBO පිළිබඳ දැනුම |
| ඉදිරි කාර්ය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි | 2 | 2023 ජනවාරි 31 | 15,500.00 | | දේශීය | ඉංග්‍රීසි කතා කිරීම පිළිබඳ දැනුම |
| රාජ්‍ය නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණය (මොඩියුලය 2) | 2 | 2023 පෙබරවාරි 21 | ගාස්තු නොමැත | | දේශීය | තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම |
| රාජ්‍ය නිලධාරීන් සඳහා SLPSAS පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 2023 මාර්තු 02,03,16,17 | ගාස්තු නොමැත | | දේශීය | රාජ්‍ය නිලධාරීන් සඳහා SLPSAS පිළිබඳ දැනුම |
| ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය | 1 | 2023 ජූලි 26,27 | 22,000.00 | | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය පිළිබඳ දැනුම |
| රාජ්‍ය අංශයේ ඵලදායිතාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 1 | මාස 06 (2023.08.03 දින සිට සෑම අඟහරුවාදා සහ බ්‍රහස්පති න්දා දිනකම 03.08.2023) | 3500.00 | | දේශීය | රාජ්‍ය අංශයේ ඵලදායිතාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව පිළිබඳ දැනුම |
| ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘති මූල්‍යකරණය සහ ණය ව්‍යුහගත කිරීම පිළිබඳ තාක්ෂණික පුහුණුව | 37 | 2023 සැප්තැම්බර් පළමු සතියේ සිට සිව් වන සතිය දක්වා | ගාස්තු නොමැත | | දේශීය | ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘති මූල්‍යකරණය සහ ණය ව්‍යුහගත කිරීම පිළිබඳ තාක්ෂණික පුහුණුව පිළිබඳ දැනුම |
| හැකියා වර්ධන පුහුණු වැඩසටහන | 110 | 2023 ඔක්තෝබර් 06,07 | ගාස්තු නොමැත | | දේශීය | හැකියා වර්ධන පුහුණුව |
| උපායමාර්ගික සාකච්ඡා කුසලතා පිළිබඳ තාක්ෂණික පුහුණුව | 37 | 2023 ඔක්තෝබර් මස තුන් වන සතිය | ගාස්තු නොමැත | | දේශීය | උපායමාර්ගික සාකච්ඡා කුසලතා පිළිබඳ තාක්ෂණික පුහුණුව පිළිබඳ දැනුම |
| රාජ්‍ය අංශයේ සාමාන්‍ය හැසිරීම සහ | 1 | 2023 දෙසැම්බර් 18 - 22 | ගාස්තු නොමැත | | දේශීය | රාජ්‍ය අංශයේ සාමාන්‍ය හැසිරීම සහ විනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව | | | | | | පටිපාටිය පිළිබඳ දැනුම |
| වාර්ෂික කොටස් සත්‍යාපනය පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 2023 ඔක්තෝබර් 26 | 13,500.00 | | දේශීය | වාර්ෂික කොටස් සත්‍යාපනය පිළිබඳ දැනුම |
| තේ පිළිගැන්වීමේ ආචාර විධි පිළිබඳ පුහුණුව | 17 | 2023 දෙසැම්බර් 22 | ගාස්තු නොමැත | | දේශීය | තේ පිළිගැන්වීමේ ආචාර විධි පිළිබඳ ප්‍රායෝගික පුහුණුව |

පරිච්ඡේදය 07

# අනුකූලතා වාර්තාව

## 7.1. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| **6.1** | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 1.3 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාළ නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම) | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | වැන්දඹු විශ්‍රාම වැටුපේ අයිතිය පිළිබඳ ගැටලුවක් හේතුවෙන් විශ්‍රාම වැටුපක් ගෙවීමට ඉතිරිව ඇත. එබැවින් නීතිමය කටයුතු අවසන් වූ පසු ඉතිරි මුදල පියවන බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දන්වා ඇත.<br><br>සේවකයාගේ රාජකාරිය අත්හිටවීම හේතුවෙන් තවත් විශ්‍රාම වැටුපක් ගෙවීමට ඉතිරිව ඇත. ලිඛිතව ගෙවීමට උපදෙස් දී ඇත | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අදාළ නොවේ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | | |
| **15** | **ආදායම් ගිණුම** | | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාළ නොවේ | | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාළ නොවේ | | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාළ නොවේ | | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | | |

# ඇමුණුම - 1

# இணைப்பு - 1

# Annexure - 1

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊපීඩී/ඒ/ඊආර්ඩී/එෆ්ඒ/2023/06 ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයයන් 6 ක ට අදාළව විචලතාවය සියයට 12 ක අඩුවීමේ සිට සියයට 213 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් වී තිබුණි.

(ආ) මූලධන වැය විෂයයන් දෙකක් සඳහා වෙන් කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කාලපරිච්ඡේදය තුළ වැය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සහ මූලධන වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.145,528,430 ක ඉතිරියක් පැවති අතර, එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 99 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් පවතින CS-DRMS ණය කළමනාකරණ පද්ධතිය ණය සේවාකරණ පුරෝකතන ඇතුළු කාර්යයන් සඳහා හඳුන්වා දී ඇති පද්ධතියක් බවත් ඒ අනුව ණය පිළිබඳ දත්ත ITMIS වෙත මාර්ගගත ක්‍රමයට යොමුකිරීම පිළිබඳව අදාල ආයතන සමඟ සාකච්ඡා සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කලද, තාක්ෂණික ගැටළු හේතුවෙන් දැනට CS-DRMS පද්ධතිය ITMIS සමඟ සම්බන්ධ කිරීම දුෂ්කර කාර්යයක් වී ඇති බවත් විගණනයට දන්වා තිබුණි. ණය කළමනාකරණ කටයුතු සමඟ මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගණුදෙනු ගිණුම්ගත කිරීමේ පහසුකම් සහිත හා/හෝ CS-DRMS පද්ධතියෙන් ITMIS පද්ධතියට අවශ්‍ය දත්ත හුවමාරු කළ හැකි පහසුකම් සහිත වූ ණය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට දෙපාර්තමේන්තුව 2024 මැයි මාසය අවසන් වන විටත් ක්‍රියාකර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි විය.

| සංවර්ධන පාර්ශ්වකරු | ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව ප්‍රදාන ඇතුලත්ව 2023 (එ.ජ.ඩො. මිලියන) | සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රදාන ඇතුලත්ව 2023 (එ.ජ.ඩො. මිලියන) | විචලනය (එ.ජ.ඩො. මිලියන) | විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු වේ ප්‍රතිශතයක් ලෙස (සියයට ) |
|---|---|---|---|---|
| ලෝක බැංකුව | 806 | 753.2 | (52.8) | (7) |
| ආසියානු සංවර්ධන බැංකුව | 1,011 | 856.9 | (154.1) | (15) |
| චීනය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) | 21 | 24.2 | 3.2 | 15 |
| ජපානය | 31 | 39.6 | 8.6 | 28 |
| කොරියාව | 10 | 0 | (10) | (100) |
| මැදපෙරදිග රටවල් | 47 | 28.9 | (18.1) | (38) |
| දකුණු ආසියානු රටවල් | 90 | 142.5 | 52.5 | 58 |
| රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් | 30 | 32.2 | 2.2 | 7 |
| IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 15 | 9.7 | (5.3) | (35) |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 682 | 681.5 | (0.5) | 0.07 |
| **එකතුව** | **2,743** | **2,568.7** | **(174.3)** | |

ඊට අදාළව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2023 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,743 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,568.7 ක් වීම හේතුවෙන් තත්‍ය උපලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො. මිලියන 174.3 කින් එනම්, සියයට 6 කින් පමණ අඩු වී තිබුණි.

(ii) දකුණු ආසියානු රටවල්, ජපානය, චීනය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව සහ රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් යන රටවල් වලින් ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙළින් සියයට 58, 28, 15 සහ 7 කින් වැඩි වී තිබුණි.

(iii) ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, මැදපෙරදිග රටවල් හා IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කළ ණය පිළිවෙළින් සියයට 7, 15, 38 සහ 35 කින් අඩු වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී කොරියාවෙන් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ද, වර්ෂය අවසාන වන විටත් ණය ලබාගෙන නොතිබුණි.

(ඈ ) CS-DRMS ණය කළමනාකරණ පද්ධතියේ අන්තර්ගත දත්ත නොසැසඳීම්

(i). විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2023 වර්ෂයේ හා 2022 වර්ෂය තුළ හෝ ඊට පෙර ප්‍රතිලාභී වූ පිළිවෙලින් රු.මිලියන 17,080.3 ක් හා රු.මිලියන 23.9 ක් වූ එකතුව රු.මිලියන 17,104.2 ක විදේශ ණය 2023 වර්ෂය අවසන් වන විටත් ගිණුම්ගත කර නොතිබුණි. එසේවුවද, විදේශීය රාජ්‍ය ණය වාර්තා කිරීමට භාවිතා කරන පරිගණක පද්ධතියේ CSDRMS 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශන සන්සන්දනය කිරීමේදී මෙලෙස ගිණුම්ගත නොකළ විදේශ ණයවල 2023 දෙසැම්බර් 31 දිනට මුළු වටිනාකම රු.මිලියන 15,823 ක් විය. ඒ අනුව රු.මිලියන 1,281.1 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් (Explanatory Notes) යටතේ සටහන් අංක 24(II) මඟින් 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණයවල මුළු වටිනාකම රු.මිලියන 17,103.2 ක් ලෙස දක්වා තිබුණි. මෙලෙස සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම මීට පෙර වර්ෂවලදී ද ප්‍රතිලාභී වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති විදේශ ණය වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ii). ණය අංක 2018003 අදාළව CSDRMS 1-854 වාර්තාවෙහි 2023 වර්ෂයට අදාළව කිසිදු ප්‍රතිලාභීවීමක් නොමැති වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 අනුව EUR 727,053 ක් ප්‍රතිලාභී වී ඇති බව දක්වා තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද තොරතුරුවල ඇමුණුම 03 අනුව මෙම ණය මුදලට අදාළව 2022 වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලාභී වී 2023 වර්ෂය තුළ ගිණුම් ගත කරන ලද ණය වටිනාකම EUR 335,930 ක් පමණක් විය. ඒ අනුව මෙම ණයමුදලට අදාළව 2023 වර්ෂය තුළ ප්‍රතිලාභී වීම් අතර EUR 391,123 ක වෙනසක් විය.

(iii). ණය ගිවිසුම් 23 ක ට අදාළව CSDRMS 1-854 වාර්තාවේ 2022 දෙසැම්බර් 31 දිනට සහ 2023 ජනවාරි 01 දිනට අදාළ ශේෂයන් අතර එකතුව රු. මිලියන 30,401 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) න් සහ අයවැය

ක්‍රියාකාරීත්වය හා හිභය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 න් සමාලෝචිත වර්ෂය තුළදී සත්‍ය වශයෙන්ම ණය ප්‍රතිලබ්ධිවීම්වල නිවැරදි වටිනාකම නිරූපණය නොවන බව ද නිරීක්ෂණය විය.

(iv). ණය ගිවිසුම් 04 ක් සම්බන්ධයෙන් එකතුව රු.821,115,454 ක සෘන ණය ප්‍රතිලබ්ධි වීම් සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සහ CSDRMS 1- 854 වාර්තාවෙන් නිරීක්ෂණය විය.

(v). රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) න් ඉදිරිපත් කර ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ව්‍යාපෘති ණය ශේෂවලට (Foreign Currency Banking Unit Loan (Project) Balances) අදාළ CS-DRMS 1-854 වාර්තාව සමඟ පරීක්ෂා කිරීමේදී 2017045 දරන ණය ගිවිසුමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට CS-DRMS 854-1 වාර්තාවෙහි සහ 2023 ජනවාරි 01 දිනට එම වාර්තාවේ USD 227,823 ක් හෙවත් රු.82,724,927 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ණය ආපසු ගෙවීම් අතර ද USD 227,823 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එහි දේශීය මුදල් වටිනාකමෙහි කිසිදු වෙනසක් නිරීක්ෂණය නොවීය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආපසු ගෙවන ලද USD 332,704 ක මුදල දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී USD ක් 1 රු.524.6050 ක් ලෙස අසාමාන්‍ය විදේශ විනිමය අනුපාතයක් යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය.

(vi). ප්‍රදායකයන් විසින් එවා තිබූ ණය ශේෂ තහවුරුකිරීම්, රජයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සහ පරිගණකගත ණය කළමනාකරණ පද්ධතියේ 854-1 වාර්තාව සමඟ සංසන්දනය කිරීමේදී ණය වර්ග 13කට අදාළව වූ ශේෂය රු.මිලියන 4,775 ක් වැඩියෙන්ද ණය වර්ග 14කට අදාළව රු. මිලියන 5,126 ක් අඩුවෙන්ද රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා වී ඇති බව නිරීක්ෂණය විය.

(vii). ප්‍රතිලබ්ධි වූ කාලපරිච්ඡේදය සලකා බැලීමේදී 2023 වර්ෂයට අදාළව ප්‍රතිලබ්ධි වූ විදේශ ණය 2023 මැයි 07 දින මුද්‍රණය කළ පරිගණක ගත ණය කළමනාකරණ පද්ධතියේ 814-1 වාර්තාවේ ඇතුළත් වුවද 2024 පෙබරවාරි 17 දින මුද්‍රණය කළ එම වාර්තාවේ ඇතුළත් වී නොමැති අතර රු.මිලියන 1,290 ක විදේශ ණය ශේෂයක් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිලබ්ධි වූ ණය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 1994 අප්‍රේල් 20 දිනැති අංක 94/30 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශාධාර සම්බන්ධ සියළු ගණුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත්

දෙපාර්තමේන්තුව විසින් කළ යුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2023 වර්ෂය තුළ එසේ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 11 ක් සඳහා එකතුව රු.මිලියන 22,210 ක විදේශ ප්‍රදාන සෘජුව ලැබී තිබුණු අතර එම වටිනාකම් ප්‍රතිපාදන සලසාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2019 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ආයතන 13 ක් සමග එකතු වටිනාකම් ජපන් යෙන් 984,000, යුරෝ 134,810,000, ඇමෙරිකානු ඩොලර් 58,417,841 කොරියන් වොන් 400,000, චීන යුවාන් 2,000,000,000 හා රු.4,545,750 ක් වූ විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹියද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම විදේශ ප්‍රදාන ලද බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවිනි.

### 3.2 වත්කම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 6 අනුව මූල්‍ය නොවන වත්කම්හි ආරම්භක ශේෂයට ගැලපීම් වශයෙන් රු. 54,542,993 ක් ගැලපීම් කර ඇති අතර රු.63,805,004 ක අපහරණයන් කර තිබුණි. කෙසේවෙතත්, එම ශේෂයන් තුළ වැරදි නිවැරදි කිරීම් ද ඇතුළත් බව නිරීක්ෂණය වූ අතර, එම වැරදි නිවැරදි කිරීම් සහ අපහරණයන් වෙන වෙනම හඳුනාගත නොහැකි විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ප්‍රකාරව, කොම්ප්ට්‍රොලර් ජනරාවරයා වෙත ඉදිරිපත් කරන ලද වත්කම් වාර්තාව, 2023 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය සමඟ පරීක්ෂා කිරීමේදී වටිනාකම එකතුව රු.18,800,000 ක් වූ වාහන තුනකට අදාළ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද වත්කම් වාර්තාවෙහි අඩංගු වී නොතිබුණි.

(ඇ) 2023 ජනවාරි 01 දිනට වාහන ශේෂය තුළ අන්තර්ගත අංක WP KK 5481 දරන ජීප් රථය සහ WP TV 1448 දරන වාහන දෙක මුදල් අමාත්‍යාංශය වෙත පවරා ඇති බවට 2023 මැයි 09 දිනැති අංක ERD/ACC/A/AQ/23 දරන විගණන විමසුම් පිළිතුරු ලිපිය මඟින් දන්වා තිබුණ ද, දෙපාර්තමේන්තු පොත්පත් අනුව එම වාහන අපහරණයන් යටතට ගෙන තිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 21 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් ද, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 06 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06 ක් පැවතුණි.

බී.ඕ.ඩී.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට